## 1.2 - භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරමු.

**නිපුණතා මට්ටම -: භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි.**

**ක්‍රියාකාරකම -: " ශෝකය " නමැති ස්ථායි භාවය නිරූපණය කරමු.**

හැඳින්වීම - රසයක් උපදින්නේ භාවයක් මුල් කොට ගෙනය.සිතෙහි පවතින හැඟීම් සමුදාය ස්ථායි භාව නමින් හැඳින්වෙන බවත් භරතමුණිවරයා පෙන්වා දී ඇත.ඒ අනුව ශෝකය නමැති ස්ථායි භාවයෙන් ප්‍රදර්ශනය වන්නේ කරුණා රසයයි. නර්තන ශිල්පියෙකුට කිසියම් චරිත නිරූපණ අවස්ථාවකදී එම භාවය නිරූපණය කිරීමට හැකි විය යුතුය.

- ✓ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අණින් තම සිඟිති දරුවා වංගෙඩියේ දමා කොටන්නට යැයි ඇහැළේපොළ කුමාරිහාමිට නියම කළ විට ඇයට කුමක් සිතෙන්නට ඇතිද?
- ✓ පුතාගේ අණින් වධ හිංසාවට ලක්වන බිම්බිසාර රජුගේ වේදනාව.
- ✓ පටාචාරා කතාවේ ස්වාමියා හා දරු දෙදෙනා අහිමි වීමෙන් පටාචාරාට ඇති වන ශෝකය.





**ඇහැළේපොළ කුමාරිහාමි**




**බිම්බිසාර රජුගේ වේදනාව**




පටාචාරා කතාව



ශෝකය නමැති ස්ථායි භාවය අවධි වන අවස්ථා -:

ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දී
වධ හිංසාවට පත් වන අවස්ථාවක දී
විපතක් සිදු වූ විට
ඇලුම් කළ යමක් අහිමි වීම
වස්තුව හානි වූ විට

සැබෑ ජීවිතයේ දී මුහුණ පාන්නට සිදුවන විපතක දී, දුකකදී අප සිතට දැනෙන ශෝකය ස්වාභාවික හැඟීමකි.එහෙත් චරිත නිරූපණ අවස්ථාවක දී උපදින හැඟීම භාවයකි.

උදා -:

- ඔබ මදක් සිතන්න වහෙස මහන්සි වී හොඳින් පාඩම් කර විභාගයට පෙනී සිටි ඔබ වඩාත් කැමතිම විෂය අසමත්ව ඇති බව දැනගත් විට ඔබට දැනෙන හැඟීම.
- ඔබට ශෝකී සංගීතයක් හෝ ගායනයක් ඇසුන විට දැණුන හැඟීම මතකයට නගා ගන්න.එය ඔබේ මනස කොතරම් සංවේදී කළාද?

ශෝකය නමැති ස්ථායි භාවය බාහිරව ප්‍රදර්ශනය වන්නේ කෙසේද?

වැලපීම
කඳුළු සැලීම
උගුර කට වියලී යෑම
සුසුම් හෙළීම,අතපය අප්‍රාණික වීම

ඔබ 6 ශ්‍රේණියේ සිට භාව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ඉගෙන ගත්තා මතක ඇති.එය මතකයට නගා ගනිමින් ඉහත ලක්ෂණ ඉස්මතු වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම් නිරූපණය කිරීමට උත්සාහ ගන්න.



- ✓ කළයක් ගෙන වතුර ගෙන ඒමට යන ගැහැණු ළමයෙකි.හදිසියේ පය පැටලී වැටී කළය බිඳෙයි.

  ( කළය බිඳුණු අවස්ථාව )
- ✓ ඔරුවක නැඟ මුහුදු ගිය තම පුතා එන තුරු වෙරළට වී මව බලා සිටී.

  ( ඔරුව කුණාටුවකට හසු වී පුතා මිය ගිය බව දක්නට ලැබුණු අවස්ථාව )
- ✓ මවක් තම දරුවා සුරතල් කරමින් සිටියි.නොසිතූ ලෙස ඇයට තම දරුවා නිවසේ තබා දුර ගමනක් යාමට සිදු වෙයි.

  ( දරුවාගෙන් වෙන්ව යන අවස්ථාවේ මවට ඇති වන ශෝකය )
- ✓ කුමාරිකාවක් මල් නෙලමින් වනයේ සැරිසරයි.හදිසියේ කටුවක් ඇනීමෙන් ඇය වේදනාවට පත් වේ.

  (කටුව ඇනී වේදනාවට පත් වන අවස්ථාව )
- ✓ ධීවරයෙක් මාළු ඇල්ලීම සඳහා ඔරුවක් දියත් කරයි.වෙහෙස මහන්සියෙන් ඔහු මුහුදේ දැලක් එලයි.එකදු මාළුවෙකුවත් දැලට හසු නොවේ.ඔහු අපේක්ෂා භංගත්වයට පත්වේ. ( මාළුන් නොමැති හිස් වූ දැල දැක ශෝක වන ධීවරයා )

ක්‍රියාකාරකම

1 . ශෝකය නමැති ස්ථායි භාවය නිරූපණය වන අවස්ථා නම් කරන්න.

2 . ශෝකය නමැති ස්ථායි භාවයෙන් උපදින රසය කුමක් ද ?

3 . එම ස්ථායි භාවය නිරූපණය කළ හැකි සිද්ධියක් ගොඩ නගන්න.

4 . ශෝකය නමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කරන්න.

සැකසුම - **H. S. V. S. H.** **දංගොල්ල බණ්ඩාර ර/ නිව්/ පැබොටුව මහා විද්‍යාලය** පැබොටුව